# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/47 - 2022 ඔක්තෝබර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

#### නිවේදනය

2022 ජූලි මස 22 වැනි දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින්, ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ 1(ආ) අනුව්‍යවස්ථාව අනුව මා වෙත පවරා ඇති විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන හා ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් අතරින්, පහත උපලේඛනයේ සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන්, ආයතන, ව්‍යාපෘති සහ අණ පනත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(4) ව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.10.07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රොෂාන් රණසිංහ,**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛන අංක 01**

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ව්‍යාපෘති* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
|---|---|---|
| 1. තාරුණ්‍යයේ ජවය සමාජ විරෝධී අංශ වෙත යොමු වීම වලක්වමින් පාසැල් අධ්‍යාපනයේ සිට විෂය බාහිර ක්‍රියාකාරකමක් වශයෙන් ද, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ හරහාද, ක්‍රීඩා කටයුතු තාරුණ්‍යය වෙත හඳුන්වා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම. | 1. දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය | • ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33) |
| 2. අධ්‍යාපනයට අමතරව ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා පාසැල් දරුවන් ආකර්ශනය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ළමා පරපුරක් සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. | 2. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනය | |


1A - G 37769 — 08 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ව්‍යාපෘති* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
|---|---|---|
| 3. දිවයින පුරා විසිරී ඇති ග්‍රාමීය පාසැල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිටම හඳුනාගෙන ඔවුන්ගේ කුසලතාවයන් ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙන ඒමට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 3. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය | |
| 4. දිවයින පුරා පිහිටි ක්‍රීඩාගාර හා ක්‍රීඩාභූමි පිළිගත් ප්‍රමිතිකරණයට ලක්කර ඒවා ඊට ගැලපෙන අයුරින් සංවර්ධනය කිරීම. | | |
| 5. දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවෙල-ක් සකස් කිරීම. | | |
| 6. ග්‍රාමීය ක්‍රීඩා සංවර්ධනය සඳහා  අවශ්‍ය ක්‍රීඩා උපකරණ සහ භාණ්ඩ බෙදා දීම. | | |
| 7. තරුණ තරුණියින් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් මතින් මුදවා ගැනීම සඳහා උපදේශනය සැපයීම. | | |
| 8. ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නායකත්වය හා පෞරුෂත්ව වර්ධනය කිරීම. | | |
| 9. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම. | | |
| 10. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා අවශ්‍ය පරිදි කටයුතු සම්බන්ධීකරණය කිරීම. | | |
| 11. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | |
| 12. තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු | | |

EOG 10 - 0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.